ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2023 . 09 . 13

පැමිණිලි පාර්ශවය : ජේ.ඒ.එස්.ආර් පෙරේරා මිය,
අංක : 21/35, පී.එල්.පී අල්විස් මාවත,
ලේවැල්ල පාර,
මහනුවර.

වගඋත්තර පාර්ශවය : විදුහල්පති,
මහාමායා විදුහල,
මහනුවර.

<u>පැමිණිලි අංකය : **HRC/K/45/23**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාර ජේ.ඒ.එස්.ආර් පෙරේරා යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තමා උපන්දා සිට අංක 21/35, පී.එල්.පී අල්විස් මාවත, ලේවැල්ල පාර, මහනුවර යන ලිපිනයේ ස්ථිරව පදිංචිව සිටින අතර, එම පදිංචි ස්ථානයට ආසන්නම පාසල වන මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ 2023 වර්ෂයේ පළමු වසරට තමාගේ දියණිය ඇතුළත් කිරිම සඳහා අයදුම්පත් යොමුකර ඇති නමුත් 2022.11.03 වන දින පැවැත්වූ ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේදී, පදිංචිය සනාථ කිරිම සඳහා ඉදිරිපත් කළ ප්‍රධාන ලේඛනයට එනම් හිමිකම් ඔප්පුවට හිමිවිය යුතු ලකුණු ලබාදී නොමැති බවයි.

තවද 2023.01.18 වන දින පැවැත්වූ අභියාචනා මණ්ඩල පරීක්ෂණයේදී තමන් විසින් ඉදිරිපත් කර ඇති කරුණු විමසා බලා අසාධාරණයක් සිදුව ඇති බව පිළිගෙන ඇති නමුත් ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබාදීමට නොහැකි බව පවසා පෙර විනිශ්චය මණ්ඩලය විසින් ලබාදී ඇති ලකුණු පමණක් නැවත ලබාදීම තුළින් දරුවාට පදිංචි ස්ථානයට ආසන්නම පාසල අහිමි වී ඇති බවත්, එමඟින් තම දරුවාගේ අධ්‍යාපන අයිතිය උල්ලංඝනය වී ඇති බවත් තවදුරටත් සඳහන් කර ඇත.

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

පාසල් වල පළමු ශ්‍රේණියට ළමයින් ඇතුළත් කරගැනීම සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 28/2022 චක්‍රලේඛයේ 6.1 වගන්තිය ප්‍රකාරව පදිංචිය තහවුරු කිරීමේ ප්‍රධාන ලේඛනවලට අනුව 'සින්නක්කර ඔප්පු හා තෑගි ඔප්පු, ප්‍රකාශන ඔප්පුවකින් ලියා ඇත්නම් එම ඔප්පුව වසර 10 හෝ ඊට වැඩි කාලයක් ලියාපදිංචි වී තිබිය යුතු බවට" දක්වා ඇති නමුත් ඉල්ලුම්කරු විසින් ඉදිරිපත් කොට ඇති ප්‍රකාශන ඔප්පුව ඇයගේ පියාගේ නමින් 2013.01.16 වන දින ලියාපදිංචි වී ඇති නිසා එම චක්‍රලේඛයට අනුව 2022.06.30 වන දින දක්වා වසර 10 ක කාලයක් සම්පූර්ණ කොට නොමැති බවට වගඋත්තර පාර්ශවය විසින් කරුණු දක්වා ඇත. මේ අනුව ඉල්ලුම්පත සලකා බැලීමේදී පදිංචිය තහවුරු කරන ප්‍රධාන ලේඛනය වන ප්‍රකාශන ඔප්පුවේ පැවැති මාස 06 ක් හා දින 16 ක් අඩු කාලය හේතුවෙන් ඔප්පුව සඳහා ලකුණු ලබා නොදී වෙනත් පිළිගත හැකි ලේඛනයට ලකුණු ලබාදීම සිදුකර ඇති බව දන්වා ඇත.

**මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-**

2023.04.26 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැවැති පරීක්ෂණයේදී වගඋත්තර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටි වයි.එම්.ආර්.සී උඩවෙල මිය හා එස්.අයි. සියඹලාකොටුව මියගේ කරුණු දැක්වීම වී ඇත්තේ, පදිංචිය සනාථ කිරිම සඳහා සලකා බලනු ලබන ප්‍රධාන ලේඛනය වන ප්‍රකාශන ඔප්පුව (හිමිකම් ඔප්පුව) 2013.01.16 වන දින ලියාපදිංචි වී ඇති බැවින් චක්‍රලේඛ 28/2022 අනුව ලකුණු ලබාදීමට නොහැකි බවයි.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකාරිය තම දරුවා මහ/මහාමායා බාලිකා විද්‍යාලයේ පළමු වන වසර සඳහා 2023 වර්ෂයේදී ඇතුළත් කිරිමට අයදුම්කර කැඳවුම් අංක ආර් 57 යටතේ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ප්‍රථම සම්මුඛ පරීක්ෂණයේ ලකුණු 71.5 හා අභියාචනා මණ්ඩලයේදී එම ලකුණු සංශෝධනය නොකොට එම ලකුණු ප්‍රමාණයම ලබාදී ඇති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට අනුව, පදිංචිය සනාථ කිරිම සඳහා ඉදිරිපත් කරනු ලැබූ අංක 5575 දරණ ප්‍රකාශන ඔප්පුව 2013.01.16 දින මහනුවර රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති අතර, පදිංචිය සනාථ කිරීමේ ප්‍රධාන ලේඛනය වන ඔප්පුව සඳහා ලබාදෙනු ලබන සම්පූර්ණ ලකුණු ප්‍රමාණය එනම්, ලකුණු 16 ප්‍රථම සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය මගින් පැමිණිලිකාරියට ලබා නොදීම මත (ඔප්පුවේ අන්තර්ගතය අනුව අවු 20කට වැඩි පදිංචියක් පවතින බව සනාථ වන බැවින්) එම ලකුණු ලබා දෙන ලෙස පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා ඇත. නමුත් අභියාචනා මණ්ඩලය ඒ සඳහා ලකුණු ලබා දී නොමැති බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරිය විසින් ඉදිරිපත් කරනු ලැබූ අංක 5575 දරණ ප්‍රකාශන ඔප්පුව මඟින් සනාථ වන්නේද පැමිණිලිකාරියගේ පියා අදාළ දේපලේ අවු 20කට වඩා වැඩි කාලයක් නිරවුල්වත් අඛණ්ඩවත් අන් අයගේ අයිතිවාසිකම් වලට ප්‍රතිකූලවත් බුක්ති විඳීමෙන් කාලාවරෝධී අයිතිවාසිකම් ලබා ඇති අතර, මෙහි දේපළ වර්ෂ 1998 ඔක්තොම්බර් මස 30 වන දින මහනුවර මහනගර සභාව විසින් ගොඩනැගිලි සැලසුමක් ඉදිරිපත් කර අනුමත කරගෙන එහි ස්ථිර නිවාසයක් සාදාගෙන පදිංචිව සිටින බවයි. අනෙකුත් පහත ලේඛන වලින්ද ඒ බව සනාථ වේ.

1. අංක 21/35, ලේවැල්ල, මහනුවර යන ස්ථානයේදී නිවාසයක් ඉදිකිරීම සඳහා මහනුවර මහ නගර සභාව විසින් 1998.10.30 වන දින ජේ.ඒ.ඒ පෙරේරා (පැමිණිලිකාරියගේ පියා) යන අයට අදාළව අනුමත කර දී ඇති ගොඩනැගිලි සැළැස්මක් ඇත.

2. අංක 221- තල්වත්ත වසම ග්‍රාම නිලධාරී විසින් 2022.07.02 දින පැමිණිලිකාරිය වෙත නිකුත් කර ඇති පදිංචි සහතිකයේ අංක 21/35, පී.එල්.පී අල්විස් මාවත, ලේවැල්ල, මහනුවර යන ලිපිනයේ කුඩා කාලයේ සිට මේ දක්වා පදිංචිව සිටින බව සඳහන් කර ඇත.

3. පැමිණිලිකාරියගේ ජාතික හැඳුනුම්පතෙහි ලිපිනය ලෙස සඳහන් කර ඇත්තේද, පැමිණිලිකාරිය දැනට පදිංචිව සිටින ස්ථානයේ එනම් අයදුම්පත් ඉදිරිපත් කරන ලද ලිපිනය බව පැහැදිලි වේ.

කරුණු එසේ හෙයින් පදිංචිය තහවුරු කිරීම සඳහා සලකා බැලිය යුතු අනෙකුත් ලේඛන වලින් 1998 වසරේ සිට අංක 5575 දරණ ප්‍රකාශන ඔප්පුවේ සඳහන් වන ඉඩමේ පැමිණිලිකාරිය ස්ථිරවම පදිංචිව සිටින බව නිරීක්ෂණය වේ.

තවද පැමිණිලිකාරිය අදාල ස්ථානයේ භෞතිකව පදිංචි පිළිබඳ ගැටළුවක් නොවන බවද වගඋත්තර පාර්ශවය පිළිගන්නා බැවින් භෞතික පදිංචියද තහවුරු වේ.

සම්මුඛ පරීක්ෂණයේදී හා අභියාචනා මණ්ඩලයේදී පදිංචිය සනාථ කිරීම සඳහා අතිරේක ලේඛන වන ජාතික හැඳුනුම්පත, විවාහ සහතිකය, දරුවාගේ උප්පැන්න සහතිකය, බැංකු පොත, ජීවිත රක්ෂණය ආදී සියළුම ලේඛන සඳහා ලකුණු 05 ක් ලබාදී ඇත.

ඊට අමතරව පදිංචිය සනාථ කිරීමේ ප්‍රධාන ලේඛනයට අදාළව ජල බිල්පත්, විදුලි බිල්පත්, වරිපනම් බිල්පත් සඳහා ද ලකුණු 1.5 ක් ලබාදී ඇත. ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචිය සඳහාද සම්පූර්ණ ලකුණු වන ලකුණු 25 ක් ලබා දී ඇත.

ඒ අනුව නිරීක්ෂණය වන්නේ, ඉදිරිපත් කර ඇති ලේඛන අනුකූලව පැමිණිලිකාරිය අදාළ ස්ථානයේ භෞතිකව පදිංචිව සිටින බවයි. නමුත් සම්මුඛ පරීක්ෂණ හා අභියාචනා පරීක්ෂණ මණ්ඩලය විසින් මේ පිළිබඳව කිසිදු සැළකිල්ලක් නොදක්වා ඇති බව නිරීක්ෂණය වේ.

ප්‍රකාශන ඔප්පුවක් මඟින් නිගමනය කරනු ලබනුයේ අදාළ ස්ථානයේ ස්ථිරව පදිංචිය හා එහිම භූමියේ හිමිකම මත ස්ථිරව සිටින බව වන හෙයින් ප්‍රකාශන ඔප්පුවක පැවැත්ම සමස්ත කරුණු අනුව නිගමනය කළ යුතුව ඇත.

ඉදිරිපත් වී ඇති ඉහත ලේඛන අනුව පැමිණිලිකාරිය කුඩාකල සිට අදාළ ලිපිනයේ පදිංචිව සිටින බව සනාථ වන බැවින් ප්‍රකාශන ඔප්පුවට වසර 10 ක කාල සීමාව සම්පූර්ණ වීමට මාස 06 දින 16 ක් අඩු වුවද ඇයට ප්‍රකාශන ඔප්පුවට හිමිවන සම්පූර්ණ ලකුණු ලබාදීම සිදුකළ යුතු බව නිගමනය කිරීමේ හැකියාව පවතී.

ඒ අනුව මහාමායා බාලිකා විද්‍යාලයේ 2023 පළමු වසර සඳහා ආසන්නතම පදිංචිය යටතේ ලැබිය යුතු අවම ලකුණු ප්‍රමාණය 79.4 ක් වන අතර, පැමිණිලිකාරිය ලැබූ ලකුණු ප්‍රමාණය 71.5 ක් වේ. මේ අනුව ඉහත නිරීක්ෂණය සැළකීමට ගැනීමේදී පැමිණිලිකාර පාර්ශවය ලේඛන අනුකූලව හා භෞතිකව ද ස්ථානයේ පදිංචි වී ඇති බව සනාථ වන බැවින් පදිංචිය සනාථ කරන ප්‍රධාන ලේඛනය වන ප්‍රකාශන ඔප්පුව සඳහා 28/2022 චක්‍ර ලේඛනයේ 6.1 වගන්තිය යටතේ ඉල්ලුම්කරුගේ කලත්‍රයාගේ, මවගේ පියාගේ නමට පදිංචි ස්ථානයේ හිමිකම් තිබේනම් 16ක් ලබාදිය යුතු බව සනාථ වන බැවින් මෙම අයටද එම ලකුණු 16 ක් ලැබිය යුතු බව පැහැදිලි වේ.

ඒ අනුව පැමිණිලිකාරිය සම්මුඛ පරීක්ෂණයේ හා අභියාචනා මණ්ඩලයේදී ලකුණු 71.5 ලබා ඇති බැවින් ඉහත කී ලකුණු ප්‍රමාණය එනම්, ලකුණු 16 ක් එක් වූ විට ලකුණු 87.5 ක් ලැබිය යුතුව පවතී. ඒ අනුව මහනුවර, මහාමායා විද්‍යාලයේ 2023 වර්ෂයේ ආසන්නතාවය පදනම යටතේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කරගෙන ඇති අවම ලකුණු ප්‍රමාණය වන ලකුණු 79.4 ට ඉක්මවා පැමිණිලිකාරිය ලකුණු ලබාගෙන ඇති බැවින් ආසන්නතාවය යටතේ පැමිණිලිකාරියගේ දැරිය පාසලට ඇතුළත් කර නොගැනීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලිකාර ජේ.ඒ.එස්.ආර්. පෙරේරා මියගේ දරුවා වන ටී. කෞෂානි විජේසූරිය දියණියගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත සඳහන් නිර්දේශය කර සිටී.**

ඒ අනුව වගඋත්තර පාර්ශවීය ක්‍රියාකලාපය හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාවෙන් සහතික කොට දී ඇති පැමිණිලි පාර්ශවයේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට අනාවරණය වී ඇති බැවින් පැමිණිලිකාරියගේ දරුවා වන ටී. කෞෂානි දියණිය වගඋත්තරකාර විද්‍යාලයේ 2023 වර්ෂයේ පළමු වසර සඳහා ඇතුළත් කළ යුතුය.

2023. 10 . 12 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාරිය විසින්ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

| | |
|---|---|
| එල්.ටී.බී දෙහිදෙණිය,<br>ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),<br>සභාපති,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. | නිමල් ජී. පුංචිහේවා,<br>කොමසාරිස්,<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. |
| [illegible] හිදෙණිය<br>ශ්‍රේෂ්ඨාධිකරණ [illegible] (විශ්‍රාමික)<br>සභාපති<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | නිමල් ජී. පුංචිහේවා<br>ජ්‍යෙෂ්ඨ නීතිඥ<br>කොමසාරිස්<br>ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |

පිටපත :-

01. ලේකම්,
    අධ්‍යාපන අමාත්‍යාංශය,
    ඉසුරුපාය, බත්තරමුල්ල.

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
    මහනුවර.

B/